**වනාතවිල්ලුව ප්‍රාදේශීය සභාව - 2022**

**---------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

වනාතවිල්ලුව ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට වනාතවිල්ලුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියාකර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශිය සභාවේ, මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේ දී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කුරුණෑගල දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් ඉකුත් වර්ෂයේදී ලබා දී තිබූ ගිලන්රථයේ වටිනාකම වූ රු.3,000,000ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | රු.ලක්ෂ 30ක තක්සේරු වාර්තාවක් ලබා දි ඇති අතර ඒ අනුව වත්කම් ලෙස ලේඛනගත කරන බව. | ජ'නල් සටහන් මගින් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.6.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.173,542,915 ක් වටිනා ඉඩම් ගොඩනැගිලි සමීක්ෂණ මණ්ඩල වාර්තාවල ඉදිරිපත් නොකිරීම නිසා සතුටුදායක ලෙස පරීක්ෂා කළ නොහැකි විය. | ඉදිරියේදී අදාල සමීක්ෂණ කටයුතු සිදු කරන බව. | ඉඩම් ගොඩනැගිලි සමීක්ෂණය සිදු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.7,232,699 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.3,141,870 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 |
| වරිපනම් හා බදු | 2,712 | 2,389 | 415 | 3,303 | 2,668 | 2,270 | 559 | 2,451 |
| කුලී | 60,254 | 40,586 | 18,061 | 7,601 | 7,944 | 38,126 | 36,554 | 2,170 |
| බලපත්‍ර ගාස්තු | 417 | 603 | 435 | 370 | 392 | 251 | 122 | 201 |
| වෙනත් ආදායම් | 29,253 | 31,399 | 29,946 | 2,439 | 8,848 | 6,377 | 2,524 | 4,849 |
| එකතුව | 92,636 | 74,977 | 48,857 | 13,713 | 19,852 | 47,024 | 39,759 | 9,671 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ වරිපනම් බදු රු.776,330 ක්, හිඟ අක්කර බදු රු.203,040 ක්, හිඟ ජල බදු රු.1,970,622 ක් සහ ව්‍යාපාර ස්ථාන තුනකට අදාළව එකතුව රු.7,690,620 ක් වූ හිඟ කුලී අයකර ගෙන නොතිබුණි. | ඉදිරියේ දි අය කිරිමට කටයුතු කරන බව. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. |
| (ආ) | වර්ෂ 05කට වරක් බල ප්‍රදේශයේ සමීක්ෂණයක් සිදුකර අක්කර බදු අයකර ගත හැකි ඉඩම් හඳුනා ගැනීමට සභාව පියවර ගෙන නොතිබුණි. | ඉදිරියේදී මෙම කාර්යය සිදුකිරීමට කටයුතු කරන බව. | අක්කර බදු අයකර ගත හැකි ඉඩම් හඳුනා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ වෙළඳ බලපත්‍ර හා ව්‍යාපාර බදු වෙනුවෙන් සමීක්ෂණයක් සිදු කර අදාළ ගාස්තු අයකර නොගැනීම හේතුවෙන් රු.811,900ක මුදලක් හිඟව පැවතුණි. | සමීක්ෂණ සිදුකර අදාල ගාස්තු අයකර ගැනීමට කටයුතු කරන අතර හිඟ මුදල් කපා හැරීමට ඉදිරියේදී කටයුතු කරන බව. | සමීක්ෂණයක් සිදු කර ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල,පිරියත හා උපකරණ

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මයිලන්කුලම ආයුර්වේද මධ්‍යස්ථානයේ රු.75,000ක් වටිනා පරිගණක යන්ත්‍රයක් නිශ්ක්‍රීයව පැවතුණි. | සභාවට ලබාගැනීමට කටයුතු කරන බව. | පරිගණක යන්ත්‍රය ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2014 හා 2016 යන වර්ෂවලදී මිලදීගත් එකතුව රු.2,811,200ක් වූ කාය වර්ධන උපකරණ තොගය හා එම කාය වර්ධන උපකරණ ස්ථාපිත කර ඇති මධ්‍යාස්ථාන 02 භාවිතා කිරීමකින් තොරව නිෂ්කාර්යව පැවතුණි. | වනාතවිල්ලුව කායවර්ධන මධ්‍යස්ථානය මේ වන විට ප්‍රයෝජනයට ගන්නා අතර, කරතිව් කායවර්ධන මධ්‍යස්ථානය බදු දීමට කටයුතු කරන බව. | කාය වර්ධන උපකරණ තොගය හා එම කාය වර්ධන උපකරණ ස්ථාපිත කර ඇති මධ්‍යස්ථාන 02 කඩිනමින් ආදායම් උත්පාදන කටයුතු සඳහා යොදා ගත යුතුය. |
| (ඇ) | වනාතවිල්ලුව අළුත් එළුවන්කුලම ගම්මානය සඳහා ජල ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට රු.2,852,687ක මුදලක් වැය කර තිබූ අතර ජල පොම්පයක් සවිකර නොමැති වීම හේතුවෙන් මෙම ව්‍යාපෘතිය නිශ්කාර්යව පැවතුණි. | පළාත් නිශ්චිත මුදල් වෙන් නොවූ අතර අප ආයතනයේ ප්‍රමාණවත් මූල්‍ය තත්ත්වයක් සහ අරමුදලේ නොතිබූ හෙයින් මෙය සිදුකිරීමට නොහැකි වූ බව. | ජල ව්‍යාපෘතිය කඩිනමින් ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2022 දෙසැම්බර් 31 දිනට සභාවට ලැබිය යුතුව තිබූ ගිණුම් ශේෂ වටිනාකම රු.18,810,263ක් වූ අතර ඒ තුළ අවුරුදු 03 ඉක්මවූ රු.1,513,137ක ශේෂයක්ද විය. | ඉදිරියේ දි අයකර ගැනීමට කටයුතු කරන බව. | ලැබිය යුතු මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතුව තිබූ ගිණුම් ශේෂ වටිනාකම රු.10,051,794ක් වූ අතර ඉන් අවුරුදු 03කට වැඩි රු. 1,921,003 ක් විය. | ඉදිරියේ දි නිරවුල් කිරිමට කටයුතු කරන බව. | ගෙවිය යුතු මුදල් කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

### 3.3 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභා බල ප්‍රදේශය තුල පවරා නොගත් දේපළ 50ක් පැවැති අතර අදාල වත්කම් පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී එය කඩිනමින් කරන බව දන්වමි. | අදාළ දේපළ පවරා ගැනීමට කඩිනමින් කටයුතු කළ යුතුය. |

### 3.4 වාහන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2020 වර්ෂයේ විශේෂ සමීක්ෂණයක් මඟින් අපහරණය කිරීමට යෝජනා කර ඇති ට්‍රැක්ටර් රථය අපහරණය නොකර දිරාපත් වෙමින් පැවතුණි. | පළාත් පාලන කොමසාරිස්තුමා දැනුවත් කර ඇති බව. | විශේෂ සමීක්ෂණ වාර්තා නිර්දේශ ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ආ) වනාතවිල්ලුව ප්‍රාදේශිය ලේකම් විසින් 2011 වර්ෂයේදී මාස 03ක කාලයක් සඳහා ට්‍රැක්ටරයක් සහ බවුසරයක් සභාවට ලබා දී තිබූ අතර එම ට්‍රැක්ටරය හා බවුසරය විධිමත්ව ආපසු භාරදීමට කටයුතු නොකර සභා භූමියේ ගාල් කර දිරාපත් වෙමින් පැවතුණි. | විධිමත් පරිදි නැවත භාර ගන්නා ලෙස ප්‍රාදේශිය ලේකම්තුමා දැනුවත් කර ඇති බව. | ට්‍රැක්ටරය හා බවුසරය විධිමත්ව ආපසු භාරදීමට කටයුතු කල යුතුය. |

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 4.1 වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුලදී කර්තව්‍යයන් 21ක් සඳහා රු. 32,160,000ක ප්‍රතිපාදන සලසා තිබුණද සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් අපේක්ෂිත ප්‍රතිඵල ලබා නොගෙන කර්තව්‍යයන් අත්හැර දමා තිබුණි. | අදාළ වැය දැරීම අවශ්‍ය නොවීම මත හා රටේ පැවති අයහපත් තත්වය මත වැය දැරීමට නොහැකි වූ නිසා අදාළ ප්‍රතිපාදන ඉතිරි වී ඇති බව. | සලසා ගත් ප්‍රතිපාදන උපයෝගී කර ගෙන අයවැය ගත කාර්යයන් නිම කිරීමට කටයුතු කළ යුතුය. |

## 4.2 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාවේ මූල්‍ය හා මෙහෙයුම් කටයුතු සම්බන්ධයෙන් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සමාලෝචිත වර්ෂය තුල සිදුකර නොතිබුණි. | ඉදිරියේදී අවශ්‍ය කටයුතු කරන බව. | වැදගත් ක්ෂේත්‍ර ආවරණය වන පරිදි විගණනය සැලසුම් කර විගණන කටයුතු සිදු කළ යුතුය. |

## 4.3 තිරසාර සංවර්ධන අරමුණු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එක්සත් ජාතීන්ගේ සංවිධානයේ තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය 2030 ප්‍රකාරව තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක හඳුනාගෙන සමාලෝචිත වර්ෂයේදී එයට අනුගත වී නොතිබුණි. | ඉදිරියේ දී නිවැරදිව කටයුතු කිරීමට වග බලා ගන්නා බව. | තිරසාර සංවර්ධන න්‍යාය පත්‍රයට අනුව අදාළ අරමුණු හා ඉලක්ක ලඟා කර ගැනීමට කටයුතු කළ යුතුය. |